# වන සංරක්ෂණය ගැන රජය ගත යුතු පියවර

මහා වන සැලැස්මක් 1995 සිට 2020 තෙක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. නමුත් එය කෙතරම් දුරකට සාර්ථකව ක්‍රියාවට නැගේදැයි කීමට අපහසු අතර, ඒ අතරතුර ක්ෂණිකව ක්‍රියාවට නැංවිය හැකි අතුරු වැඩ පිළිවෙලවල් කිහිපයක් දක්වමු. මන්ද අනාගතය සඳහා වනබිම් ආරක්ෂා කිරීමට නම් පවත්නා ප්‍රමාණයෙන් නොව, නමුත් වනාන්තර මායිම් විශාල කල යුතු අතර කුඩා වන රොදවල් පවා හඳුනාගෙන ඒවා ද ක්‍රමයෙන් පුළුල් කල යුතු ය. වනාන්තර තහවුරු කිරීමේ ක්ෂණික පියවර කිහිපයක් :

1) කඳුකරයේ හා අප රටේ සෙසු ප්‍රදේශවල පුද්ගලික මිනිසුන් විසින් වරින් වර විකිණීමට තබා ඇති තේ, පොල්, රබර් ඉඩම් හා වෙනත් කැලෑ ඉඩම් රජය මගින් මිලට ගැනීමට වෙන ම අංශයක් පිහිටුවා, ඒ ඒ මිලට ගන්නා ඉඩම්-වල ඇති ආගන්තුක ශාක ඉවත්-කර එම ප්‍රදේශවලට ආවේනික ශාක ඒවායෙහි සිටුවා කුඩා වන රොදවල් ලෙස පවත්වා ගත යුතු ය.

2)කඳුකරයේ සියලු නිසරු තේ ඉඩම් රජයට පවරාගෙන ඒවායේ පෙර තිබූ තුරු ලතා නැවත සිට-විය යුතුය. මේ සඳහා උදහරණ ලෙස පේරාදෙණිය සරසවියේ මහාචාර්ය ගුණතිලක ආදීන් වැන්නන්ගේ සහාය ලබා ගෙන එකිනෙක ප්‍රදේශවල සිටවිය යුතු ආවේනික තුරුලතා ගැන අවබෝ-ධයක් ලැබිය යුතුය.

3)මහවැලි වේලි මේ වන විට මඩ වලින් ගොඩ වී ඇති බැවින් එකිනෙක වේලි තෝරා ගෙන එහි පිරී ඇති රොන්මඩ ඉවත් කිරීමේ ක්‍රමයක් සැකසිය යුතු ය. වියලි කාල මේ සඳහා සුදුසු ය. එසේ ඉවත් කරන මඩ පස් සෝද නිසරු වී ඇති කඳු මුදුන් වලට හැකි පමණ ගෙන ගොස් දමා ඒ මත නැවත ආවේනික ශාක සිටවිය යුතු ය.

4) රටේ කඩොලාන බිම් ආශ්‍රි-තව ඇති තෙත් බිම් පවතින ගංගා දෙපස ආරක්ෂා කර මායිම් තහ-වුරු කර හැකි ඒවා අභය භූමි බවට පත් කළ යුතු ය. උදහරණ ලෙස බොල්ගොඩ ජලාශය හා ලුනාව කලපුව අභය භූමියක් කර ජලාශයේ සිට මීටර කිහිපයක් යන තෙක් ගොඩ බිම් ප්‍රදේශයේ ආරක්ෂිත වැටක් හෝ වෙනත් ලකුණක් යෙදිය යුතු ය. ලුනාව කලපුවේ දූෂිත ද්‍රව්‍ය ඉවත්කර එය නැවත සංරක්ෂණය කළ යුතු ය.

5) වන සංරක්ෂණයෙහි නියැ-ලෙන නිලධාරින්ට නූතන තාක්ෂ-ණික උපකරණ ආදී පහසුකම් ලබා දී නිලධාරි සංඛ්‍යාව වැඩි කිරීම

6) රක්ෂිත හෝ රක්ෂණ නොවන තැනක නීතිවිරෝධී හෝ ආරක්ෂිත කළුවර වැනි දැව කපා ඇති විට ඒවාට සම්බන්ධ වූ සිය-ලුම දෙනාම එයට වගකිව යුතු බවට සැලකෙන පරිදි ගසෙහි වාණිජ වටිනාකම නොව ජීවවි-ද්‍යාත්මක වටිනාකම අනුව වන්දි ගෙවීමට හැකි වන අයුරින් නීති සංශෝධනයක් කිරීම. ඒ අනුව එක් කුඩා ගසක් පවා ලක්ෂ කිහි-පයක් වනු ඇත. දැව ජාවාරම මැඩලීමට එවැනි ප්‍රබල නීති සංශෝධනයක් අවශ්‍ය ය. ❑

**එස්.එච්. පෙරේරා**